# 15

# ලූ ෂුන්ගේ කෙටිකතාවල දක්නට ලැබෙන උගතුන්ගේ ශෝකාන්තය පිළිබඳ අධ්‍යයනයක්

*ආචාර්ය නැදලගමුවේ ධම්මදින්න හිමි*

1923 අගෝස්තු මස ලූ ෂුන්ගේ මුල්ම කෙටිකතා සංග්‍රහය නා හන් (《呐喊》) නමින් බෙයිජිං ෂින් චාඕෂ (北京新潮社) ප්‍රකාශකයින් විසින් ප්‍රකාශයට පත් කරන ලදී. එහි කෙටිකතා 15ක් සංග්‍රහ වී තිබුණි. 1926 අගෝසතු මස ලූ ෂුන්ගේ දෙවන කෙටිකතා සංග්‍රහය ෆං හුආං (《彷徨》) නමින් බෙයිජිංහි දී ප්‍රකාශයට පත් විය. කෙටිකතා 10ක් එහි ඇතුළත් වී තිබුණි. උගතුන්ගේ චරිත මුල් කරගෙන රචනා වූ කෙටිකතා 15ක් මෙම කෘති දෙකෙහි දක්නට ලැබේ. ඒ අතර බොං ඊජී (《孔乙己》), සුදු රැස් (《白光》), තානායමේ දී (《在酒楼上》), හුදෙකලා මිනිසා (《孤独者》) හා ශෝක වීම (《伤逝》 නමැති කෙටිකතාවල උගතුන්ගේ ශෝකාන්ත පැහැදිලි ව දැකගත හැක්ය. බොං ඊජී හා සුදුරැස් යන කෙටිකතාවල පැරණි චීන උගතුන්ගේ ස්වරූපය හා ඔවුන්ගේ ශෝකාන්තයන් විදහා දක්වා ඇති අතර අනික් කෙටිකතා තුනෙන් ප්‍රකට වන්නේ සමකාලීන උගතුන්ගේ දුක්බර ඉරණම පිළිබඳ යථාර්ථයයි. ලූ ෂුන්ගේ සමකාලීන උගතුන් මුහුණ දුන් කටුකත්වය, ඔවුන්ගේ ආධ්‍යාත්මික බිඳ වැටීම හා අපේක්ෂා භංගත්වය තානායමේ දී නම් කෙටිකතාවේ එන ල්‍යූ වෙයිෆූ (吕纬甫), හුදෙකලා මිනිසා නම් කෙටිකතාවේ එන වෙයිලි ඇන් ෂූ (魏连殳) හා ශෝක වීම නම් කෙටිකතාවේ එන ත්ස ජුන් (涓生) හා ජුඇන් ෂං (子君) යන චරිතවලින් ප්‍රකට වේ.

වර්තමානය වන තෙක් ම චීනයේ බොහෝ විචාරකයින් ලූ ෂුන්ගේ කෙටිකතාවල දක්නට ලැබෙන උගතුන්ගේ ශෝකාන්ත පිළිබඳ විචාරය කරන විට ඊට හේතු වශයෙන් කුමන කරුණක් ඉදිරිපත් කළ ද, ඒ සියල්ලක් ම දේශපාලනික ස්වරූපයක් ගත් වැඩවසම් යුගයේ ප්‍රතිඵල ලෙස විස්තර කිරීම සාමාන්‍ය දෙයක් බවට පත් වී තිබේ. චීන සංස්කෘතිය ඇසුරින් මෙම ගැටලුව විනිවිද දැකීමට බහුතර විචාරකයින් උත්සාහ නොකරන අතර ඊට එකම හේතුව ලෙස ඔවුන් හඳුනාගෙන ඇත්තේ යල් පැන ගිය සාම්ප්‍රදායික වැඩවසම් ක්‍රමයයි. ඒ නිසා ලූ ෂුන්ගේ කෙටිකතාවල දක්නට ලැබෙන උගතුන්ගේ ශෝකාන්ත පිළිබඳ මෙකල දක්නට ලැබෙන විචාර බෙහෙවින් ඒක පාර්ශ්වික බව පැවසිය යුතුය.

උදාහරණ ලෙස දක්වතොත් සංස්කෘතික විප්ලවයෙන් ඔද්දල් වූ 70 දශකයෙහි සාහිත්‍ය විචාරකයින් විසින් මෙම ගැටලුව සම්පූර්ණයෙන් ම



දේශපාලනීකරණය කරන ලද බව පැහැදිලිව දක්නට ලැබේ. ෂාංහයි ෆුදාන් හා ෂාංහයි ෂෆන් යන විශ්වවිද්‍යාලවල චීන භාෂා අධ්‍යයන අංශ මගින් ලියා පළ කරන ලද **ලූ ෂූන්ගේ නිර්මාණ විචාරය** නම් කෘතියෙහි එක් තැනක මෙසේ සඳහන් වෙයි.

> "බොං ඊජීගේ ශෝකජනක ඉරණම නිර්මාණය කරන ලද්දේ කවරකු විසින් ද? පිළිතුරු ඇත්තේ එකක් පමණි. එනම් අතිශය කෲර වූ වැඩවසම් අධ්‍යාපන ක්‍රමය සහ සාම්ප්‍රදායික විභාග ක්‍රමයයි. වැඩවසම් පාලකයින් විසින් තමන්ට පක්ෂපාතී බැලයන් පුහුණු කරවීම පිණිස, බොං (孔) හා මං (孟) යන දාර්ශනිකයින්ගේ දර්ශන අනුසාරයෙන් ශිෂ්‍යයන්ට විෂ පොවන ලදී. උසස් නිලතල ලබා දිවිමග වාසනාවන්ත කරගත හැකිය යන මතය ඇතිකොට, තරුණ පිරිස වල්මත් කරන ලදී" (**ලූ ෂූන්ගේ නිර්මාණ විචාරය**, 148 පිටුව)[1]

හුදු දේශපාලන සංකල්ප පමණක් පදනම් කරගත් මෙබඳු විචාරවලින් ලූ ෂුන්ගේ අදහස් ප්‍රකට වන්නේ නැත. ලූ ෂුන් සාහිත්‍යකරණයෙහි නිරත වූයේ කුමන පරමාර්ථයකින් ද යන වග බොං ඊජී පිළිබඳ ඔහුගේ සමකාලීන විචාරකයෙකු සඳහන් කර ඇති මෙම ප්‍රකාශයෙන් මනාව පැහැදිලි වේ,

> "මෙයින් විස්තර වන්නේ අසරණයන් පිළිබඳව සමාජය දක්වන ඇල්මැරුණු ස්වභාවයයි" (**ලූ ෂූන් මහතා පිළිබඳ කරුණු දෙක තුනක්**, 27 පිටුව)[2]

මෙය සඳහන් වන්නේ ප්‍රාග්විප්ලවීය කෘතියක වන හෙයින් නිර්මාණ පිළිබඳ ලූ ෂුන්ගේ අදහස් මෙයින් ගම්‍ය වන බව පැහැදිලිය. තත්කාලීන චීන ජනසමාජය කවරාකාර වීද යන්න ලූ ෂූන්ගේ ම වචනවලින් පැහැදිලි කළහොත් ඒ මෙසේය.

> "ජනතාව .... විශේෂයෙන් ම චීනය ගැන බලතහොත් සදාකාලිකවම නාට්‍ය නරඹන්නන් පිරිසකි. ආත්ම පරිත්‍යාග කරන තැන චණ්ඩබවක් දිස්වේ නම්, ඔවුන් එය දකින්නේ ශෝකයෙන් හරිත බීභත්ස්‍ය රසයෙන් අනූන නාට්‍යයක් ලෙස ය. බියෙන් තැතිගත් සෙයක් දිස්වේ නම්, ඔවුන් එය දකින්නේ විකට නාට්‍යයක් ලෙස ය. බෙයිජිංහි බැටළු මස්කඩ ඉදිරියේ සතුටින් මෙන් මුව අයාගෙන බැටළුවන් හම ගසනු බලාගෙන සිටින කීප දෙනෙකු නිතරම දක්නට ලැබේ. අන් අයගේ ආත්ම පරිත්‍යාගයෙන් ඔවුන්ට වෙන යහපත මීට වඩා විශාල නැත. කෙසේ වුව ද ඉන්පසු පියවර කීපයක් ඇවිද ගිය පසු ඔවුන්ට එම සතුට ද අමතක වී යන්නේ ය" (**ලූ ෂූන් කෘති එකතුව**, 81 පිටුව)[3]

ලූ ෂුන් විසින් බොං ඊජී වැනි කෙටිකතා රචනා කරන ලද්දේ මේ නිසාය. ඉහත දක්වන ලද "බොං හා මං යන දාර්ශනිකයන්ගේ දර්ශන අනුසාරයෙන් ශිෂ්‍යයින්ට විෂ පොවන ලදී" යන සංකල්පය හා ලූ ෂුන්

විසින් බොං ර්ජී බඳු කෙටිකතා රචනා කිරීමේ පරමාර්ථ එකිනෙකට හාත්පසින්ම වෙනස් වූ අදහස් දෙකක් බව වටහා ගැනීම අපහසු නැත. බොං ර්ජී කඩඉම් විභාගයෙන් අසමත් වීම, රක්ෂාවක් නොමැති වීම, ඔහු අනුන්ගේ දේවල් සොරකම් කිරීම හෝ ආණ්ඩුවේ විභාගය සමත් උගතා විසින් පහර දී ඔහුගේ කකුල් කඩා දැමීම අතිශය කෲර වූ වැඩවසම් අධ්‍යාපන ක්‍රමයේ හෝ සාම්ප්‍රදායික විභාග ක්‍රමයේ වරදක් ද? මේ යුගයේ විචාරකයින් විසින් ලූ ෂුන්ගේ කෙටිකතාවලින් දෙන පණිවිඩය සම්පූර්ණයෙන් ම දේශපාලනීකරණය කර ඇති ලෙසක් දක්නට ලැබෙන අතර ලේඛකයාගේ මූලික අරමුණ පවා ඉන් යටපත් වී ඇත.

පශ්චාත්කාලීන විචාරකයින් විසින් මෙම වරද නිවැරදි කිරීමට යත්න දැරූ සෙයක් දක්නට ලැබෙන මුත්, ඉහත සඳහන් චරිතවල ශෝකාන්තයන්ට හේතු ලෙස ඔවුන් ද හඳුනාගන්නා ලද්දේ වැඩවසම් සමාජ ක්‍රමයයි. ඒ බව,

> "බොං ර්ජීගේ ශෝකාන්තය වනාහි එක්තරා හොඳ අවංක උගතකු තමා විසින්ම පිළිගත් වැඩවසම් ආකල්ප හා විශ්වාස කළ සාම්ප්‍රදායික විභාග ක්‍රමය නිසා මොට වී විනාශයට පත් වූ ඛේදවාචකයකි" (**ලූ ෂුන්ගේ කෙටිකතා පිළිබඳ අලුත් දැක්මක්,** 30 පිටුව)[4]

යන විචාරයෙන් ප්‍රකට වන අතර එය ද හුදෙක් දේශපාලනය මත පදනම් කරගත් විග්‍රහයක් පමණි.

දේශපාලන දෘෂ්ටිකෝණයකින් උගතුන්ගේ ශෝකාන්තය අධ්‍යයනය කිරීම හුදෙක් මතුපිටින් සිදුකරනු ලබන විචාරයක් පමණි. මක්නිසාද යත් දේශපාලන දෘෂ්ටිකෝණ යුගයෙන් යුගයට වෙනස් විය හැකි මුත්, සාමාජික තත්ත්වයන් මිනිසා ජීවත් වන සමාජය තුළ වඩාත් ගැඹුරින් ඔහුට බලපාන නිසාය. එසේම ඒවා මිනිසාගේ ඉරණම සමග බැඳුණු වඩාත් සාධනීය කාරණාය. විශේෂයෙන් ම චීනය බඳු පැරණි සංස්කෘතියකට හිමිකම් කියන රටක් තුළ මෙම තත්ත්වය මැනවින් දැකගත හැක. මේ නිසා සංස්කෘතික විචාරයකින් තොරව හුදු දේශපාලනික විචාරයක් පමණක්ම කිරීම නිවැරදි නොවන්නා සේම අසම්පූර්ණ ද වේ.

තානායමේ දී නම් කෙටිකතාවේ ල්‍යූ වෙයිඟු හා හුදෙකලා මිනිසා නම් කෙටිකතාවේ වෙයි ලිඇන්ෂ වැනි උගතුන්ගේ සිත්සතන් තුළ ඔවුනටම පොදු වූ ශෝකබරිත බවක් දක්නට ලැබේ. ල්‍යූ වෙයිඟු වනාහි "මැයි හතර ව්‍යාපාරයේ" අභාසය ලැබූ ගුරුවරයෙකු වන අතර මුලදී චීනය තුළ විශාල වෙනසක් බලාපොරොත්තු වූ මුත් පසුව පිරිහී ගිය එම යුගයේ නිෂ්ක්‍රීය පුද්ගලයකු බවට පත්විය. හුදෙකලා මිනිසා නම් කෙටිකතාවෙහි දක්වෙන වෙයි ලිඇන්ෂූ වනාහි සමාජය පිළිබඳව කලකිරුණු, දුප්පත්කමින් හා හුදෙකලාබවින් යුතුව ජීවිතය ගතකොට මියගිය උගතෙකි. ඔවුන් සියලු දෙනාම වනාහි "ෂින්හයි" විප්ලව කාලයේ 辛亥革命 ) මුල් පරම්පරාවේ අලුත් උගත්තු වෙති. ඒ



නිසා ශෝකාන්ත පිළිබඳ බොහෝ විචාරකයන් ඊට හේතු ලෙස ඇඟිලි දික්කොට පෙන්වා දෙනුයේ වැඩවසම් යුගයයි.

> "ල්‍යූ වෙයිඟුගේ ඛේදවාචකය නිර්මාණය කරන ලද්දේ අර අඳුරු සමාජය විසිනි" (**ලූ ෂුන්ගේ කෙටිකතා අධ්‍යයනය,** 85 පිටුව)[5]

ඔවුන් ජීවත් වූ ඒ අඳුරු යල් පැන ගිය අවුල් වූ යුගය තුළ ඉතා අවාසනාවන්ත සිද්ධීන් රැසක්ම සිදු වුවද, එම ශෝකාන්තයන්ට මුල් වූ කාරණා ඕනෑම යුගයක විද්‍යමාන වීමට පුළුවන. එම ශෝකාන්තයන්ට හේතුවූ කාරණා විවිධ මුහුණුවරින් හා විවිධ ස්වභාවයන්ගෙන් සෑම යුගයකම උගතුන්ගේ ජීවිතවලට බලපාන ලද බව පෙනේ. උදාහරණ ලෙස දක්වතොත් බොං ර්ජීගේ යුගයේ සාම්ප්‍රදායික විභාග ක්‍රමය හෝ රජයේ විභාග සමත් තිං (丁) උත්තමයාගේ බලතල මෙන් ම ෂින්හයි විප්ලව කාලයේ පැවති දුප්පතුන් බිහි කළ විෂම ආර්ථික ක්‍රමය බඳු ලක්ෂණ ඈත අතීතයේ පටන් අද දක්වා ද දක්නට ලැබේ.

ශෝකවීම නමැති කෙටිකතාවේ අන්තර්ගත ජුඇන් ෂං හා ත්ස ජුන් නමැති චරිතවලින් මූර්තිමත් වනුයේ ෂින්හයි විප්ලව කාලයේ දෙවන පරම්පරාවේ උගතුන්ගේ චරිත ය. මොවුන්ගේ ශෝකාන්ත පිළිබඳ අධ්‍යයනය කරන ඇතැම් විචාරකයන් පවසනුයේ වැඩවසම් යුගයේ පැවති ආභ්‍යන්තරික හා බාහිර හේතුවලින් ඔවුන්ගේ ශෝකාන්ත නිර්මාණය වූ බවය,

> "…. මෙහි සඳහන් කරන ලද අභ්‍යන්තරික හේතු නම් ඔවුන් දෙදෙනා ආධ්‍යාත්මික වශයෙන් වාෂ්පවීම ය, තව දුරටත් සවිස්තර ව සඳහන් කළහොත්, ඒ වනාහි විරුද්ධව නැගී සිටීමේ ආධ්‍යාත්මික විශ්වාසය -මරණයට පත්වීම" යි. ජුඇන් ෂං විසින් ඒ බව තමාගේම වචනයෙන් ප්‍රකාශ කොට ඇත්තේ මෙසේය. - එකල මා තුළ බලාපොරොත්තු ඇති කළ, සතුට හා ආදරය පිරි ජීවිතය සම්පූර්ණයෙන්ම මැරී ඇත. ඉතිරිව ඇත්තේ රික්තකයක් පමණි, මා යථාර්ථය සමග හුවමාරු කරගත් රික්තය විද්‍යමාන වේ" (ෆං හුඅං - ශෝක වීම)[6] මෙහි සඳහන් කරන ලද බාහිර හේතු නම්, ත්ස ජුන් හා ජුඇන් ෂං මුහුණ දුන්නා වූ ආර්ථික පීඩනයයි, විස්තරාත්මකව දක්වතොත්, ඒ වනාහි ජුඇන් ෂංගේ රැකියාව නැතිවීමත් සමගම ඇතිවූ ජීවත් වීමේ ගැටලු ය" (**නාහන් හා ෆං හුඅං තුළ දක්නට ලැබෙන ගොවි, උගත් හා කුඩා නාගරික ජනතා චරිතවල ශෝකාන්ත පිළිබඳ අධ්‍යයනයක්,** 49 පිටුව)[7]

මෙබඳු විචාර සහ පූර්වෝක්ත දේශපාලනික විචාර අතර දක්නට ලැබෙන්නේ ඉතා සමාන බවකි, ඒවා මතුපිටින් පමණක් කරන ලද විචාර වන අතර අසම්පූර්ණ ද වේ.

ලූ ෂුන්ගේ කෙටිකතාවල දක්නට ලැබෙන උගතුන්ගේ ශෝකාන්ත පිළිබඳ සාකච්ඡා කරන විට සමාජය පිළිගත් උගතා යනු

කවරෙක් ද, ඔහුගෙන් වන ප්‍රයෝජනය කුමක් ද යන්න විමසා බැලීම අත්‍යවශ්‍යය.

'උගතා' යන තේරුමැති මුල්ම චීන වචනය වන්නේ මෙකල භාවිත වන ' 知识分子 ' යන වචනය නොව ' 士 ' හෝ ' 士民 ' යන්නය. 'ශබ්දෝත්පත්ති' නම් ශබ්ද කෝෂයෙහි ' 士民 ' වචනය විග්‍රහ කර ඇත්තේ මෙසේය,

> "අතීත කාලයෙහි සිව් වැදෑරම් ජනයා[8] අතර ශිල්ප ශාස්ත්‍ර හෝ සටන් කලාව උගත් ජන කොටස" (**ශබ්දෝත්පත්ති**, 346 පිටුව)[9]

එසේම **චීන මහා ශබ්දකෝෂයෙහි** මෙම වචනය විග්‍රහ කර ඇත්තේ මෙසේය,

> "සෑහෙන තරමක විද්‍යාත්මක හා සංස්කෘතික දැනුමක් ඇති මොළය වෙහෙසා වැඩකරන පුද්ගලයා. උදාහරණ ලෙස දක්වතොත් මහාචාර්යවරුන්, ඉංජිනේරුවරුන්, වෛද්‍යවරුන්, ගණකාධිකාරිවරුන්, සංස්කාරකයින්, වාර්තාකරුවන් හා කලාකරුවන් ආදි පිරිස ය" (**චීන මහාශබ්ද කෝෂය**)[10]

ඈත අතීතයේ පටන් වර්තමානය දක්වා ම චීනයේ උගත්තු සාම්ප්‍රදායික චීන උගතුන්ගේ භූමිකාව දිගටම රඟ දක්වමින් සිටිති. ඔවුහු තමනටම ආවේණික වූ පන්තියක් ලෙස සංවිධානය වූ පිරිසක් නොවූ අතර, බහුතර පිරිස පාලක පන්තිය වෙනුවෙන් සේවය කරමින් ජීවිකාව කරගත් අය වූහ. මේ අනුව බලන විට චීනයේ උගතෙකු හා වෙනත් රටවල උගතුන් අතර පැහැදිලි වෙනසක් දැකගත හැකි බැවින් චීනයේ උගතකු 'සාම්ප්‍රදායානුකූල චීන උගතෙකු' ලෙස නම් කිරීමට පුළුවන. වර්තමාන ඇතැම් විචාරකයින් චීන උගතුන්ගේ මෙම සුවිශේෂ ලක්ෂණය මැනවින් හඳුනාගෙන ඇති බව ද පෙනේ. එම නිසා මෙබඳු අදහසක් ඉදිරිපත් වී ඇත,

> "ඔවුහු කිසිදු නිශ්චිත භෞතික නිෂ්පාදන ක්‍රියාවලියක නිරත නො වෙති. තම තමන්ගේ දේශපාලනික, හමුදා, ආර්ථික හෝ සංස්කෘතික දැනුම හා හැකියාවන් ම ජීවනෝපාය මාර්ග බවට පත්කරගෙන සිටිති. ඒ නිසා ඔවුන් හා පාලක පන්තිය අතර බිඳලිය නොහැකි ඉතාමත්ම සමීප සබඳතාවක් දක්නට ඇත" (**උගතා හා චීන සමාජ විපරිණාමය**)[11]

මෙය වනාහි සාම්ප්‍රදයික චීන සංස්කෘතිය තුළ දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණයකි. ඉතිහාසය තුළ උගතුන් විසින් සමාජයට අති විශාල මෙහෙයක් කරන ලද නමුත් තමන්ට ආවේණික ස්ථිර ධනෝපාර්ජන ක්‍රමයක් ඔවුන්ට දිගටම නො වීය. ඔවුන්ගේ ඉරණම තීරණය කරන ලද්දේ පාලක පන්තිය විසිනි. මෙය වනාහී සාම්ප්‍රදායික උගතෙකුගේ එක් ලක්ෂණයක් පමණි. ඔහු තුළ දක්නට ලැබෙන තවත්



ලක්ෂණයක් නම්, මහත්මයෙකු ( 君子 ) වීමේ බලාපොරොත්තුවයි. චීන උගතෙකු අනිවාර්යයෙන් ම මහත්මයෙකු ද විය යුතුය. චීන අධ්‍යාපනඥයෝ මෙම කාරණය මැනවින් හඳුනාගෙන සිටිති,

> "අධ්‍යාපනය වනාහි මිනිසා අරමුණ කොට පවතී. මිනිස් සංවර්ධනය තුළ අධ්‍යාපනයේ කාර්යභාරය විය යුත්තේ කුමක් ද යන වග මුල පටන් ම පර්යේෂකයින් විසින් සාකච්ඡාවට භාජනය කරන ලද කාරණයකි. පැරණි චීන අධ්‍යාපනඥයන්ගෙන් බහුතරයක් මනුෂ්‍යත්වයට මුල් තැන දෙමින් අධ්‍යාපනය වනාහි මිනිසාගේ ස්වභාවය වෙනස් කරන මාර්ගයක් ලෙස හඳුනාගත්හ. එසේ ම මානව සංවර්ධනයට තුඩුදෙන කාරණයක් ලෙස ද විස්තර කළහ" (**චීන අධයාපන ඉතිහාසය**, 311 පිටුව)[12]

මහත්මයෙකු වීම වනාහි ආධ්‍යාත්මික ගුණ වගාවෙන් පරිපූර්ණ වූ අයෙකු වීම ද වන බව මංතුමාගේ ( 孟子 ) පහත සඳහන් ප්‍රකාශයෙන් පැහැදිලි වේ,

> "මංතුමා විසින් මෙසේ කියන ලදී, මහත්මයා මානව දයාවෙන් හරිත හදවතින් යුක්තය, ආචාරශිලීත්වයෙන් පිරුණු සිතින් යුක්තය. මානව දයාවෙන් යුත් තැනැත්තා මිනිසුන්ට ආදරය කරයි. ආචාරශීලීත්වයෙන් යුත් තැනැත්තා මිනිසුන්ට ගෞරව කරයි" (මංත්ස - **ලී ලොව් ෂ්‍යා** පරිච්ඡේදය)[13]

මංතුමා විසින් පැහැදිලි කරන ලද මහත්මා ගතිගුණවලින් පිරුණු උගතා මෙබඳු ලක්ෂණවලින් යුක්ත වන අතර, ඔහු සාමාන්‍ය මිනිසුන්ගෙන් වෙනස් වනුයේ උගත්කමත් සමග උසස් ආධ්‍යාත්මක ගුණ වගාවෙන් ද යුක්ත වන හෙයිනි.

සම්ප්‍රදායානුකූල උගතෙකු වීම ඉතාමත්ම අපහසු කාරණයකි. ඔහු ඉතා දුකසේ ඉගෙනගත යුතු විය. ඉගෙන ගන්නා කාලය තුළ කිසිදු ආර්ථික වාසියක් නොලැබෙන අතර විද්‍යාර්ථියාට බොහෝ ධනය, ශ්‍රමය හා කාලය ද වැය වන්නේ ය. බොංතුමාගේ ( 孔子 ) **ලුන් යූ** කෘතියෙහි මෙබඳු ප්‍රකාශයක් දක්නට ලැබේ,

> "මහත්මයා කුස පිරෙන්නට අහරක් නො සොයයි, සුවසේ වසන්නට නො සිතයි, වචනය හා ක්‍රියාව පිළිබඳව පමණක් සොයයි, මාර්ගය හඳුනාගෙන ඒ අනුව නිවැරදි වෙයි. හොඳින් ඉගෙන ගැනීම නම් මෙයයි" (**ලුන් යූ - ෂුඑ අර් වීඇන්** නම් පළමු පරිච්ඡේදය)[14]

ඔවුහු භෞතික දේවල්වල නොඇලෙමින් ආධ්‍යාත්මික පක්ෂයටම මුල් තැන දෙමින්, දුකසේ අධ්‍යාපනය ලබන අතරම උගතා නමැති චීන සංකල්පය ආරක්ෂා කරන ලද නමුත් බෙහෙවින් දුඃඛිත ජීවිත ගත කළහ. මෙය ද චීන උගතුන්ගේ විශේෂ ලක්ෂණයකි, සාම්ප්‍රදයික උගතුන් බහුතරයකගේ ඉරණම ද මෙයම ය. ඔවුන්ගේ අනිවාර්ය ගමන් මාර්ගය ද මෙයමම විය. මෙම සංස්කෘතික පසුබිම අනුසාරයෙන් ලූ ෂුන්ගේ

කෙටිකතාවල දැක්වෙන උගතුන් විමසා බැලීම එක් යුගයකට පමණක් සීමා නොකළ යුතුය. උදාහරණ ලෙස බොං ර්ජී නම් චරිතය සඳහන් කළ හැකිය. සාම්ප්‍රදායික චීන උගතුන් පිළිබඳ යථාර්ථය අවබෝධ කරගත් විට බොං ර්ජී වනාහි පැරණි චීන උගතෙකු පිළිබඳ නිදසුනක් නොව කතුවරයා විසින් පැරණි උගතුන්ගේ ගති ලක්ෂණ විවේචනය කිරීම පිණිස යොදාගත් චරිතයක් පමණක් බව පැහැදිලි වෙයි. චීන ඉතිහාසය හා සංස්කෘතිය ඇසුරින් මෙම ගැටලුව විස්තර කිරීමෙන් පමණක් බොං ර්ජී නම් චරිතය නියෝජනය කරන සමාජ ව්‍යුහය හඳුනාගත හැකිය. පාලක පන්තියට සේවය කොට සිය ජීවිකාව කරගෙන යෑමේ සාම්ප්‍රදායික චීන උගතකුගේ ගතිලක්ෂණ බොං ර්ජී වෙතිනිදු දිස්වුව ද, ඔහුගේ අධ්‍යාපනය අසාර්ථක වූ හෙයින් ජීවිකාව කරගත නොහැකි වූ නිසා එන්න එන්නම දුප්පත් වූ අතර අවසානයේ ද හිඟාකන තත්ත්වයට පත් විය. නමුත් ඔහුගේ ඇතැම් චරිත ලක්ෂණ සම්ප්‍රදායානුකූල චීන උගතකු තුළ දක්නට ලැබෙන මහත්මා ගුණයන්ගෙන් වෙනස් වූ බව ප්‍රකට වන්නේ ලූ ෂුන් විසින් ඔහු පිළිබඳ කරන ලද මෙම විස්තරයෙනි,

> "නමුත් අභාග්‍යකට මෙන් ඔහුගේ ඇති නරක පුරුදු නම් දැඩි බීමත්කම හා නුපුරුදුකමයි. තව ද, වැඩක් භාරගෙන වැඩි දවසක් ගතවීමට මත්තෙන් පොත්පත්, කඩදාසි, පෑන් හා තීන්ත පමණක් නොව මිනිහා ද අතුරුදහන්ය. කීප වරක්ම මෙසේ සිදුවූ නිසා ඔහුට පොත්පත් පිටපත් කරන්නට කථාකරන අයෙකුදු සොයා ගත නොහැකි වූයේය. මෙලෙස දිවි ගැටගසා ගැනීමට ද ක්‍රමයක් නොවූයෙන් බොං ර්ජී හදිසියේ ම පොඩි පොඩි සොරකම් ද කළේය" (බොං ර්ජී)[15]

මහත්මයෙකු වීම චීනයේ පැරණි උගතකුගේ ප්‍රධාන අරමුණක් වූ නමුදු බොං ර්ජීගේ දුර්වල චරිතයෙන් ඒ බවක් පසක් නො වේ. මේ නිසා එම චරිතය වනාහි පැරණි චීන උගතකු පිළිබඳ නිදසුනක් වන්නේ කෙසේ ද? තවද ඔහු ජීවත් වීම පිණිස සොරකම් කළාට අමතරව පොත් පත් ද සොරකම් කරයි! බොං ර්ජීගේ වචනයෙන් ම ප්‍රකාශ කළහොත්,

> "පොතක් හොර හිත නැතිව ගත්තට හොරකම් කළා වෙන්නේ නෑ.... උගතුන්ගේ කටයුත්තක්, හොරකම් කළා වෙන්නේ කොහොම ද?" (බොං ර්ජී)[16]

මෙම ආකල්පය වනාහි මහත්මයා පිළිබඳ සාම්ප්‍රදායික චීන විග්‍රහයට හාත්පසින් ම විරුද්ධ අදහසක් බව අමුතුවෙන් කිවයුතු නො වේ. එසේම "බීමත්කම හා නුපුරුදුකම" වනාහි චීන උගතකු තුළ දක්නට ලැබෙන සාමාන්‍ය ලක්ෂණ නොව, බොං ර්ජී තුළ දක්නට ලැබෙන පෞද්ගලික දුර්වලතා ය. මේ නිසා බොං ර්ජීගේ චරිතය පැරණි චීන උගතුන් පිළිබඳ නිදසුනක් ලෙස ඉදිරිපත් කළ නොහැකිය. පැරණි සම්ප්‍රදායානුකූල චීන උගතකු තුළ තිබිය යුතු මහත්මා ගුණ පවා



ඔහුගෙන් ගිලිහී ගොස් ඇති නිසා, ලූ ෂුන් විසින් බොං ර්ජී චරිතය නිර්මාණය කරන ලද්දේ පැරණි චීන උගතුන්ගේ ගති ලක්ෂණ විවේචනය කිරීමට බව මනාව පැහැදිලි වේ. මෙම නිදසුනෙන් උගතුන්ගේ ශෝකාන්තවලට තුඩුදුන් හේතුව ලෙස වැඩවසම් යුගය පෙන්වා දීමට නොහැකි අතර ම දේශපාලන දෘෂ්ටිකෝණ ආශ්‍රයෙන් කළ විචාරවලින් ද ඊට තුඩු දුන් සත්‍ය පසුබිම හඳුනාගත නොහැක.

කෙසේ වතුදු ලූෂුන්ගේ කෙටිකතාවල දක්නට ලැබෙන උගතුන්ගේ ශෝකාන්ත සම්ප්‍රදායානුකූල චීන උගතුන්ගේ එක් පැතිකඩක් නිරාවරණය කරන බව නම් අවිවාදයෙන් ම පිළිගත යුතු ය. බොං ර්ජී ඇතුළු එම සියලුම චරිතවල සම්ප්‍රදායානුකූල චීන උගතුන්ගේ ගති ලක්ෂණ අඩු වැඩි වශයෙන් දැක ගැනීමට පුළුවන. සාම්ප්‍රදායික චීන උගතුන් කවරාකාර ද යන්න ඉහත විස්තර කරන ලද චීන උගතුන්ගේ ගති ලක්ෂණ ආශ්‍රයෙන් පැහැදිලි කර ගැනීමට අපහසු නැත. ඒ අනුව,

1. ඔවුහු තමන්ටම ආවේණික පන්තියක් ලෙස සංවිධානය වූ පිරිසක් නොවූ අතර බහුතර පිරිස පාලක පන්තිය වෙනුවෙන් සේවය කරමින් සිය ජීවිකාව සලසා ගත්හ.
2. ඔවුහු දැඩිව '士' නමැති සංකල්පයෙහි ගැලී සිටියහ. කුමන හේතුවක් නිසාවත් වෙනස් වීමට අකමැති වූ ඔවුහු නිතරම උගතා නැමති සංකල්පයෙන් ඉවත් වීමට උත්සාහ නො කළහ.

මෙම කරුණු දෙක ඔස්සේ ලූ ෂුන්ගේ කෙටිකතාවල දක්නට ලැබෙන උගතුන්ගේ ශෝකාන්තය පිළිබඳ විග්‍රයක යෙදීම වඩාත් කාලෝචිත වේ.

බොං ර්ජී හා චන් ෂචං (陈士成) වැනි පැරණි චීන උගතුන්ගේ අරමුණ වූයේ සාම්ප්‍රදායික විභාග සමත් කොට උගතුන් වීම පමණක්ම ද? නැත. ඔවුන්ගේ එකම අරමුණ වූයේ පාලක පන්තිය ඇසුරෙන් සිය ජීවිකාව කරගෙන යාමයි. සාම්ප්‍රදායික විභාග ක්‍රමය වනාහි ඒ සඳහා භාවිත කළ හැකි මාධ්‍යයක් පමණි. රජයේ රැකියාවක් ලබා ගැනීම පිණිස ඔවුහු දහදුක් විඳිමින් මෙම විභාග සමත් වීමට ප්‍රයත්න දැරුවෝය. ඉදින් එම විභාග සමත් වීමට නොහැකි වී නම් කිසිවෙකුට ඔවුන්ගෙන් එතරම් ප්‍රයෝජනයක් නැත. බොං ර්ජී හා චන් ෂචං වැන්නෝ මෙබඳු පරාජිතයෝය. නමුත් පවත්නා සමාජ ක්‍රමය තුළ ඔවුනට ද ජීවත් වීමට මගක් නැත්තේම නො වේ. ඒ බව,

> "බොං ර්ජී මුල දී ඉගෙන ගත් මුත් විභාග අසමත් වූ බවත්, දිවි ගැට ගසා ගැනීමට ක්‍රමයක් නොවූයෙන් සිඟමනට බට බවත්, සමහරු ඔහු නැති තැන කීහ. මේ නිසාදෝ ලිවීමට අමාරු මුත් හොඳින් ලියන ලද අකුරු කීපයකට හෝ වෙන අයෙකු පිණිස පිටපත් කරන ලද පොතකට බත් පතක් හුවමාරු විය" (බොං ර්ජී)[17]

එසේම චන් ෂචං ද 'කොට්ඨාස විභාගයට' දහසය වතාවක් ලිව්ව ද

එයින් සමත් වීමට නොහැකි වූ මුත් ඔහු ගුරුවරයෙකු ලෙස වැඩ කළේය. මේ අනුව බලන විට ඔවුන්ගේ ශෝකාන්තවලට බලපෑ එකම හේතුව සාම්ප්‍රදායික විභාග ක්‍රමය නොවන බවත් ඊට වෙනත් හේතු ද තිබිය යුතු බවත් පැහැදිලි වේ. එනම් මේ චරිතද්වය හා සම්බන්ධ ශෝකාන්ත නිර්මාණය වීමෙහි ලා චීන උගතුන්ගේ පෞද්ගලික දුර්වලතා ද බෙහෙවින් බලපා ඇති බව පසක් වෙයි.

ඔවුන් කෙරෙහි දක්නට ලැබෙන උසස් උගතුන් වීමේ බලවත් අධ්‍යාශය බොහෝ විට වෙනස් නො වේ. ඒ නිසා තමන් උගතුන්ය යන මානය ඇතිවීමත්, සමාජය එම අදහස් විහිළුවට ලක් කරන ආකාරයත් මෙම චරිතවලින් මොනවට පැහැදිලි වේ. බොං ඊජී වනාහි අධ්‍යාපනයේ සියලු කඩඉම් ජයග්‍රහණය කළ අයෙකු නොවුණ ද, ඔහු ද උගතෙකි. එපමණක් නොව සම්ප්‍රදායානුකූල චීන උගතකු වීමේ බලාපොරොත්තුව ඔහු තුළ දැඩි ව පවතී. ඒ බව,

> "කවුන්ටරයට පිටදී සිටගෙන මත්පැන් බොන එක ම - මහත්තයා" බොං ඊජී ය" (බොං ඊ ජී)[18]

> "අඳින ලද්දේ 'මහත්තුරුන්ගේ' ඇඳුමක් වුව එය කිලිටිය, එසේ ම ඉරිලාය, අවුරුදු දහයකින් වත් නොඑළලූ, නොසේදූ ලෙසකි. කෙසේ වතුදු ඔහු අන් අයට කීවේ තමා ඉතා ම සෘජු ව කතා කරන බවය, එසේ ම හේ නිතර අනිත් අය අන්දමන්ද කළේය. බොං ඊජීගේ වාසගම කොන්ෆියුසියස්තුමාගේ වාසගම හා සමානය" (බොං ඊජී)[19]

ආදී වශයෙන් ලූ ෂූන් විසින් දක්වා ඇති විස්තරවලින් පැහැදිලි වේ. කිසිවෙකු හෝ තමාගේ උගත්කම විහිළුවට ගත් විට හේ බෙහෙවින් අසන්තෝෂයට පත්විය. ඒ බව ලූ ෂූන් විසින් කෙටිකතාවෙහි මැනවින් විස්තර කර තිබේ.

> "බොං ඊජී වඩියෙන් අඩක් බිව් පසු මුහුණේ පෙර තිබූ රතු පැහැය ක්‍රමයෙන් සාමාන්‍ය තත්ත්වයට හැරෙද්දී ළඟ සිටින අයෙක් නැවතත් මෙසේ ඇසූහ. "බොං ඊජී, තමුසෙ ඇත්තටම අකුරු දන්නව ද?" බොං ඊජී ප්‍රශ්නය ඇසූ පුද්ගලයා දෙස බලමින් එය ගණන් නොගත් සෙයක් ඇඟවීය. නමුත් ඔවුහු නොනවත්වා ම කියා ගෙන ගියහ. "උඹ ආණ්ඩුවේ විභාගයෙන් බාගයක් වත් පාස් කරගතතේ නැත්තේ මොකද ආ?" මෙවිට බොං ඊජී හදිසියේ ම නොසන්සුන් බවක් ඇඟවීය. මුහුණ අළු පැහැ ගැන්විණි. එසේම මුවින් යමක් කියවිණි. නමුත් ඔහු සියල්ල පෙර මෙන අපැහැදිලි ඒවාය (බොං ඊජී)[20]

තමාගේ 'උගත්කම' ආරක්ෂා කර ගැනීමටත්, අන් අය විසින් තමාගේ 'උගත්කම' විහිළුවකට ලක්කරන විට ඊට එරෙහිව නැගී සිටීමටත් බොං ඊ ජී උත්සාහ කළ ආකාරය මේ අනුව පැහැදැලි වේ.



බොං ඊජී තවත් කෙනෙකුට යමක් ඉගැන්වීමට දක්වන්නේ බලවත් කැමැත්තකි. තැබෑරුමේ රැකියාවෙහි නිරත ව සිටින 'මට' 'අනස්ඵල' නමැති අකුර ලියන ආකාරය ඉගැන්වීමට ඔහු උත්සාහ කරන්නේ ද ඒ නිසාය. නමුත් අවුරුදු දොළහක් වයසැති 'මා' පවා ඔහුව පහත් කොට සලකා,

> "කාටද ඕනෑ ඔබේ ඉගැන්වීම්? ඒ අකුර ලියන්නේ, අකුර උඩ තණකොළවලට ලියන කොටස; යට 'හුයි' කියන අකුර; එහෙම නො වෙයි ද?" (බොං ඊජී)[21]

යනුවෙන් ප්‍රතිචාර දක්වයි. මෙවිට බොං ඊජීගේ ප්‍රතිචාර කෙබඳු ද?

> "බොං ඊජී අතිශයින් ම සතුටට පත් වූ සෙයක් දක්වමින්, ඇඟිලි දෙකක දිගට වැවුණු නියවලින් කවුන්ටරයට තට්ටු කරන අතර හිස වනමින් මෙසේ කීවේය. ඔව්, ඔව්!" (බොං ඊජී)[22]

මෙයින් ප්‍රකට වන්නේ බොං ඊජී තමාගේ උගත්කම ආරක්ෂා කර ගැනීමට හා තමාගේ තත්ත්වය රැක ගැනීමට උත්සාහ කළ ආකාරයයි.

බොං ඊජී වනාහි මෙබඳු පුද්ගලයෙකි. නමුත් ප්‍රතිඵලය වූයේ තමාට ජීවත් වීමට තරම් ජීවනෝපාය මාර්ගයක් තිබුණ ද තම පෞද්ගලික දුර්වලතා කරණකොට ගෙන එම අවස්ථාව ද නැතිවීමයි. ඉන්පසු හේ සොරකමට පවා පෙළඹුණු අතර එම වැරදි ක්‍රියාව පවා 'උගතුන්ගේ කටයුත්තක්' ලෙස හැඳින්වීමට පෙළඹුණේය. අවසානයේ දී ආණ්ඩුවේ විභාගය සමත් "තිං" මහත්තයාගේ දේවල් සොරකම් කොට හසු වී පහර කා අත් පා කඩා දැමීමෙන් පසු මරණයට පත්විය. බොං ඊජීගේ චරිතයෙන් විද්‍යමාන වනුයේ සාම්ප්‍රදායික චීන උගතකු කෙරෙහි දක්නට ලැබෙන ඇතැම් ගතිගුණ හා පෞද්ගලික දුර්වලතාය. ඔහුගේ ම දුර්වලතා නිසා රැකියාවක් සොයා ගත නොහැකිවීමත්, ආකල්ප වෙනස් කර ගැනීමට උත්සුක නොවීමත් හා සාම්ප්‍රදායික චීන උගතකු ලෙස පෙනී සිටීමට දක්වන ලද බලවත් ආශාවත් නිසා ඔහුගේ ජීවිතය ශෝකාන්තයක් බවට පත්විය.

චන් ෂචංගේ ශෝකාන්තය මීට වඩා වෙනස් ස්වරූපයක් ගනී. බොහෝ විචාරකයන් අදහස් කරනුයේ සුදුරුස් නම් කෙටිකතාවේ එන චන් ෂචංගේ චරිතය බොං ඊජීගේ  චරිතයත් සමග බෙහෙවින් සමාන බවය. මෙම චරිත දෙකෙන්ම ප්‍රකට වනුයේ සාම්ප්‍රදායික විභාග ක්‍රමය නිසා පරාජිත භාවයට පත්වූවන් බව ඔවුන් ප්‍රකාශ කරන නමුත් එම මතය හුදෙක් මතු පිටින් කරන ලද විග්‍රහයක් පමණක් බව පැවසීමට පුළුවන. චන් ෂචං සිය දිවි හානිකර ගැනීමට හේතුව කොට්ඨාස විභාගය අසමත් වීම වුව ද ඔහු වනාහි සමාජයේ ගෞරවයට පාත්‍ර වූ පුද්ගලයෙකි. බොං ඊජී මෙන් හිංසාවට හා උපහාසයට ලක් නොවූ ඔහු දිවිනසා ගන්නා ලද්දේ කොට්ඨාස විභාගය සමත් ව පාලක පන්තියට සේවය කර උසස් තිලයක් දැරීමේ බලාපොරොත්තුව සුන්වීම නිසාය. චන් ෂචංගේ අරමුණ සාම්ප්‍රදායික චීන උගතුන්ගේ අරමුණු සමඟ බෙහෙවින් ම

සැසදේ. අවාසනාවකට මෙන් දහසය වතාවක් විභාගයට වාඩි වුව ද ඔහුට එය සමත් කර ගැනීමට නොහැකි විය. ඔහුගේ අදහස මෙබඳුය,

> "....අවංක අයෙකු වීමෙන් අගනුවර නිලධාරියෙකු වීමට පුළුවන, එහෙම නැත්නම් වෙන අතක් බලාගැනීම වඩා හොඳය" **(සුදු රූස්)**[23]

රජයේ තනතුරක් දැරීමෙන් පාලක පන්තියට සේවය කළ හැකිය. ඒ අනුව චන් ෂචං බලාපොරොත්තු වන්නේ උසස් ජීවිතයක් ගතකිරීමය. එසේ ම අන් අයගේ ගෞරවයට පාත්‍ර විය හැකි සේ ම ආර්ථික වශයෙන් ද උසස් තත්ත්වයකට පත්වීමට පුළුවන. එහෙත් අවසානයේ දී හේ අපේක්ෂාභංගත්වයට පත් විය. මේ අනුව බලන කල සාම්ප්‍රදායික චීන උගතකු කෙරෙහි දක්නට ඇති ගතිලක්ෂණ චන් ෂචං චරිතයෙන් ද මැනවින් ප්‍රකට වේ. එසේම අසරණ වීම නිසා සාම්ප්‍රදායික චීන උගතුන් ඇතිකරගන්නා අපේක්ෂාභංගත්වය හා වෙනස්වීමට ඇති අකැමැත්ත ද මෙම චරිතයෙන් ප්‍රකට වේ. අලුත් පරම්පරාවේ චීන උගතුන් පිළිබඳ අධ්‍යයනය කරන විට පෙනෙනුයේ, ඔවුන්ගේ ආධ්‍යාත්මයන් බිඳ වැටීමට සහ ජීවන දුකට හේතු වී ඇත්තේ සම්ප්‍රදායානුකූල චීන උගතුන් කෙරෙහි දක්නට ලැබෙන ආකල්ප ඔවුන් වෙතින් ද විද්‍යමාන වීම නිසා බවය. ඒ නිසා ඔවුන් ද අයත් වනුයේ සාම්ප්‍රදායික චීන උගතුන්ගේ ගණයට ම ය.

තානායමේ දී නම් කෙටිකතාවේ එන ලූ වෙයිෆූ වැනි චරිතයක් මෙම සාම්ප්‍රදායික ක්‍රමයට විරුද්ධ වීමට උත්සාහ කළත්, අකමැත්තෙන් හෝ පවත්නා ක්‍රමය තුළ පාලක පන්තියට සේවය කොට ජීවත් වීම හැර වෙන අතක් නො දකියි.

මේ අනුව ඔහුගේ කාර්යභාරය වන්නේ ද සාම්ප්‍රදායික චීන උගතෙකු ලෙස පාලක පන්තියට මෙහෙවර කොට ජීවිකාව කර ගැනීමය. ඔහුගේ ආකල්ප හා ක්‍රියා කලාප අතර දක්නට ඇත්තේ විශාල පරස්පර විරෝධතාවකි. එකල සිටි ඇතැම් උගත්හු පවත්නා සමාජ ක්‍රමය ප්‍රතික්ෂේප කිරීමට උත්සහ කළත් අවසානයේ දී විප්ලව ගැන කථා කරමින්, වැඩවසම් යුගයට විරුද්ධ වෙමින් පැරණි උගතුන් අනුගමනය කළ පිරිසක් බවට පත්වූහ. ලූ වෙයිෆූට වෙන විකල්පයක් නොතිබුණු බව මෙයින් පැහැදිලි වේ. බොං ර්ජී මෙන් තමා ගැන නොසලකා සිටීමට හෝ චන් ෂචං මෙන් පිස්සු වැටී සිය දිවි හානි කර ගැනීමට ඔහුට අවශ්‍ය නොවූ අතර සාම්ප්‍රදායික චීන උගතුන් ගිය මග යෑමට හේ තීරණය කළේය. ඒ අනුව ගුරුවරයෙකු ලෙස කටයුතු කරමින් සිය ශිෂ්‍ය ප්‍රජාව ගැන ඔහු මෙසේ කියයි,

> "උන්ගේ තාත්තලාට ඕනෑ උන්ට මේව උගන්නන්න, මම ඉතින් නිකම් ම නිකම් පිටස්තරයෙක්, මේ වැඩකට නැති දේවල්වලින් ඇති පලේ මොකක්ද? ඔන්න ඔහේ ඕනෑවට එපාවට, ...." **(තානායමේ දී)**[24]

මේ අනුව තානායමේ දී නම් කෙටිකතාවේ එන ලූ වෙයිෆූ වනාහි සිත යටින් සාම්ප්‍රදායිකත්වයට විරුද්ධ වූවත් ඊට එරෙහි ව කිසිදු



පියවරක් නොගන්නා උගතෙකි. කෙසේ වුව ද හුදෙකලා මිනිසා නම් කෙටිකතාවේ එන වෙයි ලිඅැන්ෂූ නමැති චරිතය මොහුට වඩා වෙනස්ය. වෙයි ලිඅැන්ෂූ වනාහි ඉතාමත් ම දුකසේ ජීවත් වන උගතෙකි. ඔහු කෙතරම් දුප්පත් ද යත්, යහළුවෙකුට ලිපියක් තැපැල් කර යැවීමට මුද්දරයක්වත් මිලට ගැනීමට ඔහුට වත්කමක් නැත. පවත්නා සමාජ ක්‍රමය පිළිබඳ කලකිරීමෙන් පසුවන ඔහු වඩා සුන්දර අනාගතයක් ප්‍රාර්ථනා කරයි. ඒ නිසා ඔහු මෙසේ කීමට ඉතාමත් කැමතිය,

> "කොහොමත් ළමයි තමයි හොඳ! ඒ අය ඔක්කොම උපතින්ම පිවිතුරුයි .... " **(හුදෙකලා මිනිසා)**[25]

ළමයින් නරක් කරනුයේ වැඩිහිටියන් විසින් බව ඔහුගේ අදහසයි, ඒ බව,

> "වැඩිහිටියන්ගේ නරක ගතිගුණ ළමයින් ළඟ නැහැ. පස්සේ කාලේ නරක දේවල්, උදාහරණ ලෙස කියනවා නම්, ඔබ නිතර ම පහරදෙන නරක දේවල්, ඒව ඔක්කොම පරිසරය විසින් උගන්නපුව. මුල දී ඒ අය කොටින් ම නරක නැහැ, උපතින් ම පිවිතුරුයි.....මම හිතන්නේ චීනයට තියෙන බලාපොරොත්තුව මෙපමණයි" **(හුදෙකලා මිනිසා)**[26]

කිසිදු සමාජ පන්තියකට ගැති වී ජීවත් වීමට ඔහුගේ අදහසක් නැතත්, දුක් කම්කටොලු මැද ඔහු වෙතින් ජීවත්වීමේ බලාපොරොත්තු තුරන් ව ගොසිනි. ඒ නිසා ඔහු මෙසේ ප්‍රකාශ කරයි,

> "මිනිහෙකුගේ ජීවිතය වෙනස් වන්නේ කොයි තරම් වේගයෙන්ද? මාස හයක කාලයක ඉඳන් මම හුඟක් දුරට හිඟන්නකුගේ තත්ත්වයට පත්වෙලා, ඇත්තට ම කියනවා නම්, තව ම හිඟන්නෙක් කියල කියන්නත් බැහැ. ඒ වුණාට මම කළයුතු යැයි හිතෙන දෙයක් තියෙනවා, ඒ වෙනුවෙන් මම හිඟන්නෙකු වෙන්න, සීතලෙන් හා බඩගින්නෙන් මිරිකෙන්න, හුදෙකලා වෙන්න හෝ දුක් විඳින්න කැමතියි. නමුත් මැරෙන්න කැමති නැහැ. බලන්න, එක්තරා ආසාවක් මාව දවස් කීපයක් ජීවත් කළා. ඒ ශක්තිය ඒ තරම් ම විශාලයි. ඒ වුණාට දැන් ඒක නැතිවෙලා, ඒක පවා නැති වෙලා" **(හුදෙකලා මිනිසා)**[27]

වෙයි ලිඅැන්ෂූ පිළිබඳ සත්‍ය තත්ත්වය නම්, ඔහු ද සම්ප්‍රදායානුකූල චීන උගතුන් හා සමාන බවය, තමන්ට ආවේණික ස්ථිර ධනෝපායන ක්‍රමයක් ඔහුට ද නැති අතර රජයේ නිලධාරියෙකු හෝ ගුරුවරයෙකු වීමට ද ඔහු අකමැතිය. ලූ වෙයිෆූ හා ඔහු අතර දක්නට ලැබෙන ප්‍රධාන වෙනස මෙයයි. මේ නිසා ඔහුට ජීවත් වීමට අවකාශයක් නැත, ඇතැම් විට ඔහු බොං ර්ජී මෙනි, එබඳු චරිතවලින් අන් අයට ඇති ප්‍රයෝජනය කුමක් ද? එම නිසා මෙම ලෝකය අත්හැර යාමට වෙයි ලිඅැන්ෂූට අවශ්‍යය.

කුඩා කල උගතුන් වීමේ බලවත් ආශාවෙන් මඩනා ලදුව සාම්ප්‍රදායික චීන උගතුන් බවට පත් වුව ද, තමතමන්ගේ ජීවිතවල විශාල අඩුවක් ඇති බව ඔවුන්ට වැටහී ඇත. මේ වනාහි සාම්ප්‍රදායික චීන උගතුන්ගේ ඉතාමත් ම දුක්බර පැතිකඩකි.

ශෝක වීම නම් කෙටිකතාවේ එන ජුඅැන් ෂං හා ත්සු ජුන්ගේ ශෝකාන්තයන්ගෙන් විස්තර වනුයේ ෂින්හයි විප්ලවයෙන් පසු බිහි වූ දෙවන පරම්පරාවේ උගතුන් පිළිබඳ තොරතුරුය. ඔවුහු ද සාම්ප්‍රදායික චීන උගතුන් වන නමුත් අලුත් සංස්කෘතික විපර්යාසයේ ආභාසය ලබමින් සාම්ප්‍රදායික උගතුන්ට වඩා වෙනස් ජීවන රටාවකට මතුපිටින් උරුමකම් කී පිරිසක් බවට පත්වූහ. ඔවුන් දෙදෙනාගේ ආකල්පවලින් පැහැදිලි වනුයේ 'තමා' පිළිබඳ විශාල දියුණුවක් ඔවුන් ලබා ඇති බවය. "මම මමමයි, මගේ අයිතිවාසිකම්වලට කිසි ම කෙනෙකුට බලපෑම් කළ නො හැකිය" (ශෝකවීම)[28].

මෙබඳු ස්වාධීන ආකල්ප ඔවුන් දෙදෙනාට ම තිබුණ ද ඔවුන්ට උරුම ශෝකාන්තය නිර්මාණය වූයේ කෙසේ ද යන්න විමසා බැලීම වටී.

එකිනෙකාට ආදරය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන් දෙදෙනා විවාහ වුව ද, ඔවුන් ද අයත් වනුයේ සාම්ප්‍රදායික චීන උගතුන් ගණයට ම ය. විවාහ වීමට පෙර එකිනෙකා හොඳින් අවබෝධ කර ගැනීමට ඔවුනට ඉඩක් නොලැබුණු අතර විවාහයෙන් පසු තමා හා ත්සු ජුන් අතර පවත්නා වෙනස්කම් ජුඅැන් ෂංට අවබෝධ වන්නට විය. එසේ ම රැකියාව අහිමි වීම නිසා ආර්ථික වශයෙන් මෙන් ම මානසික ව ද ඔහු බිඳවැටෙන්නට විය. ඔවුන් දෙදෙනා අතර පැවති අන්‍යෝන්‍ය සම්බන්ධතාව වඩාත් නරක අතට හැරෙන්නට වූයේ මින් පසු ව ය. ජුඅැන් ෂං මෙම ගැටලුව විසඳා ගන්නේ කෙසේ ද? ස්ථිර ධනෝපායන ක්‍රමයක් ඔහුට ද නැත. තමාගේ උගත්කම මත රඳා පවතිමින් සාම්ප්‍රදායික චීන උගතකු ලෙස ඔහු ජීවත්වීමේ ගැටලුව විසඳා ගැනීමට උත්සාහ කළත්, අවාසනාවකට මෙන් උගතුන්ට පමණක් සීමා වූ රැකියාවක් ඔහුට සොයාගත නොහැකි වෙයි.

සාම්ප්‍රදායික චීන උගතකුගේ දෘෂ්ටිකෝණයෙන් ප්‍රශ්නය දෙස බලනු විනා ඔහුට වෙන විසඳුමක් නැත. ඒ නිසා ඔහු මෙබඳු අදහසක් ප්‍රකාශ කරයි,

> "මම අන්තිමේ දී පොදු පුස්තකාලය තුළ මාගේ දෙව්ලොවට සමවදිමි. එහි ප්‍රවේශපත්‍ර මිලට ගතයුතු නැත, කියවීම් ශාලාව තුළ යකඩ පෝරණු දෙකක් සවිකර ඇත. නොමියෙන පණසුන් ජීවවායු පෝරණු ඔහේ දැල්වෙමින් තිබුණත් ඒවා දල්වා ඇතිබව දුටු විට මානසික වශයෙනුදු කිසියම් උනුසුමක් දනෙයි" (**ශෝකවීම**)[29].

ඔහු නැවතත් උගතා නමැති මනෝ ලෝකයට ප්‍රවිෂ්ට වී ඇත්තේ මෙලෙසය. මෙලෙස ප්‍රශ්නය නිරාකරණය කරගත හැකි ද? ජුඅැන් ෂංගේ ක්‍රියාකලාපයෙන් පැහැදිලි වන්නේ ඔහු යථාර්ථයට මුහුණ දීමට දක්වන අකමැත්තයි. තව ද ඔහු කල්පනා කරනුයේ ත්සු ජුන්ගෙන් ඈත්වීමෙන්



පමණක් ගැටලුව විසඳා ගත හැකි බවයි. ඔහු හා ත්සු ජුන් අතර පවත්නා ආදරය වනාහි 'අන්ධ ආදරයක්' (ශෝකවීම)[30] ; "පළමු ව මිනිස්සු ජීවත් විය යුතුයි. ආදරය වනාහි ඉන්පසු ව බැඳී ඇති කාරණයකි." (ශෝකවීම)[31] යනුවෙන් ඔහු තවදුරටත් කල්පනා කරයි. ඔහුගේ මෙම ආකල්පය ත්සු ජුන්ගේ මරණයට තුඩු දුන්නේය. කෙසේ වුව ද ඔහු ඇත්ත වශයෙන් ම ත්සු ජුන්ට ආදරය කළේය, එසේ ම තව දුරටත් ඇයට ආදරය කරයි, එසේ නොවන්නේ නම්,

> "මට තව දුරටත් ඉතිරි ව ඇත්තේ ගායනා බඳු වැළපිලි හඬවල් ය, ත්සු ජුන්ගේ අවසන් කටයුතු කිරීමය, සියල්ල අමතක කරමින් අවමංගල්‍යය පැවැත්වීමය" (ශෝකවීම)[32].

යනුවෙන් ප්‍රකාශ කරන්නේ නැත. මේ දෙදෙනාගේ ශෝකාන්තයට හේතුව ආදරය හෝ ආර්ථික ප්‍රශ්න නොව ඔවුන් තුළ පැවති සාම්ප්‍රදායික ආකල්ප ය. අලුත් සම්ප්‍රදායක් ඇති වීමෙන් තමන්ගේ සියලු ප්‍රශ්න විසඳේවි යැයි ජුඅැන් ෂං කල්පනා කළ අතර ඔහුගේ ජීවිතය අඳුරට වැටුණේය. මන්ද යත් ඔහු සිතූ එම අලුත් සම්ප්‍රදාය පවා අයත් වූයේ සාම්ප්‍රදායික චීන උගතුන්ගේ අදහස් ගොන්නටමය.

මේ අනුව දේශපාලනික දෘෂ්ටිකෝණවලින් ලූ ෂුන්ගේ කෙටිකතාවල දක්නට ලැබෙන උගතුන් හා ඔවුන්ගේ ශෝකාන්ත අධ්‍යයනය කිරීම විශාල අත්වැරැද්දක් පමණක් නොව අනෙකුත් අනුමාන ප්‍රතික්ෂේප වීමට ද එය තුඩු දෙන්නේය. බොහෝ විචාරකයින් මතුපිටින් පමණක් මෙම ගැටලුව සාකච්ඡා කර ඇති සෙයක් පෙනෙන්නේ මේ නිසාය. සාම්ප්‍රදායික චීන සංස්කෘතියෙහි උගතාගේ භූමිකාව ඇසුරෙන් එම ශෝකාන්ත පිළිබඳ අධ්‍යයනය කිරීම වඩාත් ප්‍රතිඵලදායක වෙයි. ලූ ෂුන්ගේ කෙටිකතාවල දක්නට ලැබෙන උගතුන්ගේ ශෝකාන්තවලට හේතු සෙවිය හැක්කේ මේ ආකාරයෙන් පමණි. තමන්ට ආවේණික ස්ථිර ජීවනෝපායන ක්‍රමයකට ඔවුන් උරුමකම් නොකී අතර පාලක පන්තියට සේවය කිරීමෙන් ම පමණක් සිය ජීවිකාව සලසා ගැනීම ඔවුන්ගේ එක ම අරමුණ වී තිබිණි. තව ද 'උගතා' නමැති සංකල්පය ඔවුන්ගේ සිත් තුළ දැඩි ව නිදන්ගත ව පැවති අතර ඔවුන් තුළ තිබූ නොවෙනස්වනසුලු සාම්ප්‍රදායික ගතිලක්ෂණ මෙම ශෝකාන්තවලට බලපා ඇත. මෙම කරුණු සියල්ලක් ම ඔවුන්ගේ ශෝකජනක ඉරණම් කෙරෙහි බලපා ඇති ආකාරය වටහා ගැනීම අසීරු නැත.

## පාදක සටහන්

1. ෆුදාන් හා ෂාංහයි ෂෆන් විශ්වවිද්‍යාල චීන භාෂා අධ්‍යයන අංශ සංස්., (1974), ලූ ෂුන්ගේ නිර්මාණ විචාරය, ෂාංහයි මහජන ප්‍රකාශකයෝ
（复旦大学、上海师大中文系（1974），《鲁迅作品分析》，上海人 民出版社）

2. සුන් ෆූ යුඇන්, (1942?), ලූ ෂූන් මහතා පිළිබඳ කරුණු දෙක තුනක්, ලේඛක පොත් හල ප්‍රකාශනයක්
（孙伏园（1942？），《鲁迅先生二三事》，作家书屋出版）
3. **ලූ ෂූන් කෘති එකතුව** (1996), ගුවං ෂි ජනවාර්ගික ප්‍රකාශකයෝ
（《鲁迅全集》（1996），广西民族出版社）
4. **ලූ ෂූන්ගේ කෙටිකතා පිළිබඳ අලුත් දැක්මක්**, (1986), මහජන විශ්වවිද්‍යාලයීය ප්‍රකාශකයෝ
（《鲁迅小说新论》（1986），人民大学出版社）
5. **ලූ ෂූන්ගේ කෙටිකතා අධ්‍යයනය** (1989), ටීඇන් ජින් මහජන ප්‍රකාශකයෝ
（《鲁迅小说研究》（1989），天津人民出版社）
6. ෆං හුඅං （彷徨・伤逝）
7. **නා හන් හා ෆං හුඅං තුළ දක්නට ලැබෙන ගොවි, උගත් හා කුඩා නාගරික ජනතා චරිතවල ශෝකාන්ත පිළිබඳ අධ්‍යයනයක්, ලූ ෂූන්** අධ්‍යයනය, (1985.6)
（论《呐喊》《彷徨》中的农民、知识分子、小市民形象的悲剧性，
《鲁迅研究》（1985.6））
8. සිව් වැදෑරුම් ජනයා නම්, උගත්, වෙළඳ, ගොවි හා කම්කරු ජනතාවයි.
9. **ශබ්දෝත්පත්ති** (1995), බෙයිජිං ෂාං වූ ඉන් පොත්හලේ ප්‍රකාශනයකි.
（《辞源》（1995），北京商务印书馆出版）
10. **චීන මහා ශබ්ද කෝෂය** (1995), ෂාංහයි චීන මහා ශබ්දකෝෂ ප්‍රකාශකයෝ
（《汉语大词典》（1995），上海汉语大词典出版社）
11. **ජිආ චුන්ත්සං** (1996), උගතා හා චීන සමාජ විපරිනාමය, චීන භාෂා ප්‍රකාශකයෝ
（贾春增（1996），《知识分子与中国社会变革》，华文出版社）
12. **සුන් ෂෙයිචිං** (1993), චීන අධ්‍යාපන ඉතිහාසය, නැගෙනහිර චීන ගුරු විශ්වවිද්‍යාල ප්‍රකාශකයෝ, ෂාංහයි
（孙培青（1993），《中国教育史》，华东师范大学出版社）
13. **මංත්ස** - ලී ලොව් ෂ්‍යා පරිච්ඡේදය
（《孟子・离娄下》）
14. **ලුන්යූ** - ෂුඑ අර් වීඇන් නම් පළමු පරිච්ඡේදය. 14වන පාඨය
（《论语・学而篇第一》一四）
15. බොං ඊජී（《孔乙己》）



16. එම
17. එම
18. එම
19. එම
20. එම
21. එම
22. එම
23. සුදුරැස්（《白光》）
24. තානායමේදී（《在酒楼上》）
25. හුදෙකලා මිනිසා（《孤独者》）
26. එම
27. එම
28. ශෝකවීම（《伤逝》）
29. එම
30. එම
31. එම
32. එම

## ආශ්‍රිත ග්‍රන්ථාවලිය


《鲁迅全集》，广西民族出版社，1996
《鲁迅小说全篇》，国际文化出版公司，1994
《鲁迅研究》，1980 1993
王富仁，《先驱者的形象》，浙江文艺出版社，1987
复旦大学、上海师大中文系.《鲁迅作品分析》，上海人民出版社，1974
孙伏园，《鲁迅先生二三事》，作家书屋出版，1942？
《鲁迅小说新论》，人民大学出版社，1986
《鲁迅小说研究》，天津人民出版社，1989
贾春增，《知识分子与中国社会变革》，华文出版社，1996
孙培青，《中国教育史》，华东师范大学出版社，1993
《孟子》
《论语》